# වාර්ෂික සේවා සමීක්ෂණය - 2021
## ප්‍රශ්ණාවලිය (ASS) සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

ශ්‍රී ලංකාව සඳහා නිල සංඛ්‍යාලේඛන සැපයීමේ බලය ලත් ප්‍රධාන ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව විසින් මෙරට සේවා අංශයේ ප්‍රවර්ධනයට අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීමේ අරමුණින් වාර්ෂික සේවා සමීක්ෂණය සිදුකරනු ලැබේ. ඒ සඳහා වූ දත්ත රැස් කිරීමට සකස් කරන ලද ප්‍රශ්ණාවලිය **(ASS)** කොටස් 5 කින් සමන්විතය. මෙම ප්‍රශ්ණ සඳහා පිළිතුරු සැපයීමේ දී ඔබට උපදෙස් අවශ්‍ය වන්නේ යැයි හැඟෙන ප්‍රශ්ණ සඳහා පැහැදිලි කිරීම් පහත දැක්වේ. එම උපදෙස් අනුව ප්‍රශ්ණාවලිය සම්පූර්ණ කරන මෙන් ඉල්ලා සිටින අතර, මේ සම්බන්ධයෙන් වැඩි දුරටත් උපදෙස් අවශ්‍ය වන්නේ නම් කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා අංශයේ අධ්‍යක්ෂ අමතන්න. **(දු.ක.011-2147401)**

## ASS ප්‍රශ්නාවලියෙන් ආවරණය වන සේවා විෂය පථය

| | |
|---|---|
| H | ප්‍රවාහනය හා ගබඩා කිරීම |
| I | නවාතැන් හා ආහාරපාන සැපයීම |
| J | තොරතුරු හා සන්නිවේදන ප්‍රකාශන කාර්යයන් |
| L | දේපල වෙළඳාම් කාර්යයන් |
| M | වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කටයුතු |
| N | පරිපාලනමය හා සහායක සේවා කටයුතු |
| P | අධ්‍යාපනය |
| Q | මහජන සෞඛ්‍යය හා සමාජ සේවා කටයුතු |
| R | කලා හා පොදු විනෝදාත්මක කටයුතු |
| S | අනෙකුත් සේවා කටයුතු |

## යොමු කාලය

මෙම සමීක්ෂණයේදී යොමු කාලය වනුයේ 2020 ලිත් වර්ෂය (2020 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා) වේ. එහෙත් අදාල ආයතනය ගිණුම් පවත්වාගෙන යනු ලබන්නේ 2020/ 2021 මුදල් වර්ෂය සඳහා නම් (2020 අප්‍රේල් 01 සිට 2021 මාර්තු 31 දක්වා) ඒ සඳහා දත්ත ලබා ගත යුතුය.

## වර්ෂ 2020 හෝ මුදල් වර්ෂ 2020/2021ට අදාළ තොරතුරු

### 1.2.9 ආර්ථික ක්‍රියාකාරකමේ ස්වභාවය

- ආයතනයේ ආදායමට ඉහළ දායකත්වයක් සපයන ආර්ථික ක්‍රියාකාරකම පිළිබද විස්තර මේ යටතේ දැක්විය යුතුය.
- කේත කිරීමට නියමිත බැවින් ආර්ථික ක්‍රියාකාරකම වඩාත් පැහැදිලිව සඳහන් කල යුතු වේ. උදා - නීති සේවා සැපයීම, ළදරු පාසල

### 1.2.11 ආයතනයේ ලියාපදිංචිය

අදාල කේත කව කරන්න

- ආයතනය, මෙහි සඳහන් ආයතන එකකට වැඩි සංඛ්‍යාවක ලියාපදිංචි වී ඇත්නම් ඒ සියල්ලම කව කරන්න
- ආයතනය, මෙහි සඳහන් ආයතන වලින් බාහිර වෙනත් ආයතනයක ලියාපදිංචි වී ඇත්නම් වෙනත් යටතේ අංක 8 කව කර එය සඳහන් කරන්න.

**1.2.14 ආයතනය ක්‍රියාකාරකම් සිදු කරන ලද කාල සීමාව**

ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරනු නොලබන ආයතන සඳහා මෙම කොටස අදාල වේ.

- වැඩ කරන සතියකදී සාමාන්‍යයෙන් වැඩ කරන පැය ගණන
- වැඩ කරන මාසයකදී සාමාන්‍යයෙන් වැඩ කරන දින ගණන
- 2020 වර්ෂයේදී වැඩ කරන ලද සති ගණන

## 02 කොටස - වර්ෂ 2020 හෝ මුදල් වර්ෂ 2020/2021 සඳහා සේවා නියුක්තිය, වැටුප් හා වේතන සහ 2021 ජූලි 31 දිනට රැකියා පුරප්පාඩු

පහත සඳහන් කාණ්ඩ වල කාර්යය මණ්ඩලය ආයතනයේ සේවා නියුක්තිය යටතේ ඇතුළත් නොකළ යුතු ය.

- අසීමිතව නිවාඩු ලබා සිටින්නන්
- විශ්‍රාම ගිය පුද්ගලයින්
- උප කොන්ත්‍රාත් කරුවන් විසින් ගෙවනු ලබන බාහිර සේවකයින්
- වෙනත් ආයතනයකින් ලබා ගන්නා ලද කාර්යය මණ්ඩලය
- සංස්ථාගත සමාගම් වල අධ්‍යක්ෂවරු
- කොටස් හිමියන්ගේ කමිටුවේ සාමාජිකයින්

**2.1.12 අර්ධ කාලීන සේවකයින්**

- දිනකට පැය 6 කට අඩුවෙන් සේවය කරන **සහ**
- මසකට දින 20 කට අඩුවෙන් සේවය කරනු ලබන සේවකයින් අර්ධ කාලීන සේවකයින් ලෙස සැළකේ.

**2.2.1 දළ වැටුප් හා වේතන**

මූලික වැටුපට දිරි දීමනා, අතිකාල ගෙවීම්, පාරිතෝෂික දීමනා, ජීවන වියදම් එකතු කල පසු වටිනාකම

**2.2.2.1 සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවායෝජකයින් දායකත්වය**

- සේවක අර්ථ සාධක අරමුදලට සහ
- සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවායෝජකයින් විසින් කරන ගෙවීම්

**2.2.2.2 අනෙකුත් සමාජ රක්ෂණ දායක මුදල්**

සේවා යෝජකයා විසින් සේවකයාගේ සුරක්ෂිතතාව සඳහා රක්ෂණ ක්‍රම වලට ගෙවන දායක මුදල් ආදිය

**2.2.2.3 වෙනත් මූල්‍යමය දීමනා**

- අසනීප, දරු ප්‍රසූතියකදී, අනතුරු නිසා සේවයට නොපැමිණීම වෙනුවෙන් දෙනු ලබන සෘජු දීමනා.
- ණය සහන වාරික ආදිය
- ඉන්ධන සඳහා ගෙවීම්
- ආහාර සඳහා දීමනා
- ගෙවල් කුලී

**2.2.2.4 ද්‍රව්‍යමය ගෙවීම්**

නොමිලේ හෝ ඉතා අඩු මිලට සේවකයන්ට සපයන භාණ්ඩ හා සේවා වෙනුවෙන් දරන ලද වියදම

උදා- ආහාර, නිල ඇඳුම්, නිල නිවාස, වාර ප්‍රවේශ පත්‍ර, ප්‍රවාහන පහසුකම්, බැංකු පොලී අනුපාතයෙන් යම් ප්‍රතිශතයක් ගෙවීම, ඉන්ධන

**2.3 ඔබ ආයතනයේ 2021 ජුලි 31 දිනට පවතින වැඩිම පුරප්පාඩු සංඛ්‍යාවක් ඇති රැකියා 05 සඳහන් කර එම ප්‍රමාණයන් දක්වන්න.**

## 03 කොටස - මුදල් වර්ෂ 2020 හෝ 2020/2021 සඳහා වියදම්

### 3.1 ආයතනයේ වියදම්

**3.1.1 වෘත්තිය සේවා සඳහා වියදම්**

විශේෂීකරණය වූ ආයතන මඟින් ඉටු කරවා ගන්නා ලද සේවාවන්ට කරන ලද ගෙවීම්

- ආයතනයේ විගණන කටයුතු
- නීතිමය කටයුතු ආදිය සඳහා වැය වූ මුදල

**3.1.2 ආරක්ෂක කටයුතු සඳහා වියදම් -** වර්ෂය තුල ආරක්ෂක කටයුතු සඳහා වැය කල මුදල

- මුරකරුවන් යෙදවීම
- ආරක්ෂක සේවා සපයන ආයතන වලින් ලබා ගත් සේවය සඳහා කරන ලද ගෙවීම්

**3.1.3 අධ්‍යාපන සහ පුහුණු වියදම්**

ආයතනයේ නිලධාරින් , සේවකයන් පුහුණු කිරීමට සහ ඔවුන්ගේ උසස් අධ්‍යාපනය සඳහා වැය වූ මුදල (දේශීය හෝ විදේශීය)

**3.1.4 අනෙකුත් ආයතන හෝ පුද්ගලයන්ගෙන්, කොමිෂන් හෝ උපකොන්ත්‍රාත් පදනම මත කරන ලද වැඩ සඳහා ගෙවීම්**

අඩු පිරිවැයකින් කර ගත හැකි වීම නිසා හෝ නව දැනුම, යන්ත්‍ර සූත්‍ර , පුහුණු ශ්‍රමය නොමැති වීම , යන හේතු මත වෙනත් ආයතන වලට ලබා දුන් වැඩ සඳහා කල ගෙවීම්

**3.1.5 අළුත්වැඩියා සහ නඩත්තු වියදම් -** වර්ෂය තුළ සුළු නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සඳහා වැය කල මුදල මෙහි සඳහන් කරන්න.

ආයතනයේ ස්ථාවර වත්කම් වැඩි දියුණු කිරීම සඳහා විශාල පිරිවැයක් දරන ලද අවස්ථා වලදී එම මුදල මෙහි සඳහන් නොකල යුතුය.

උදා - ගොඩනැගිල්ලක සම්පූර්ණ වහල ගලවා පිරිසකර කිරීම සඳහා වැයවූ මුදල මෙහි සඳහන් නොකල යුතුය.

නමුත් වහලේ සෙවිලි තහඩුවක් කැඩී ඇතිවිට එය සකස් කිරීම සඳහා වැයවූ මුදල මෙහි සඳහන් කල යුතුය.

කුලියට ගත් ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර සුළු නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සඳහා වැය කල මුදලද මෙයට අයත් වේ.

**3.1.8 ගොඩනැගිලි සඳහා ගෙවන ලද බදු කුලී**

ආයතනයේ ප්‍රයෝජනය පිණිස බද්දට ලබා ගන්නා ලද ගොඩනැගිලි වලට වර්ෂයට අදාළව ගෙවන ලද බදු වටිනාකම පමණක් මෙහිදී සඳහන් කළ යුතුය.

**සැ.යු.: -** සේවක නිවාස, අයිතිකරුගේ නිවාස, කළමනාකරුවන්ගේ නිවාස ආදිය සඳහා ගෙවන බදු කුලිය මෙයට ඇතුළත් නොවේ.

**3.1.9 ඉඩම් සඳහා ගෙවන බදු කුලිය -** ආයතනයේ ආර්ථික ක්‍රියාකාරකම පවත්වාගෙන යනු ලබන ඉඩම සඳහා වර්ෂය තුල ගෙවනලද මුදල

**3.1.10 යන්ත්‍රෝපකරණ වෙනුවෙන් ගෙවන ලද බදු කුලී**

බද්දට ගන්නා ලද උපකරණ, යන්ත්‍ර සූත්‍ර ආදිය සඳහා වර්ෂයට අදාළව ගෙවන ලද බදු වටිනාකම පමණක් මෙහිදී සඳහන් කළ යුතුය.

**3.1.11 ස්ථාපනය කිරීමේ වියදම් -** වර්ෂය තුල ආයතනය මිලදී ගත් යන්ත්‍ර සවි කිරීමේ කටයුතු වෙනුවෙන්

වැයකල මුදල

**3.1.12 ප්‍රවාහන වියදම් ( පුද්ගල සහ භාණ්ඩ )**

- ගුවනින් හා මුහුදෙන්
- දුම්රිය හා මාර්ග මගින්
- අභ්‍යාන්තර ජල මාර්ග මගින්, සිදු කළ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් වැය කල මුදල

**3.1.13 පණිවිඩ හුවමාරු**

වර්ෂය තුල ආයතනයේ කටයුතු වෙනුවෙන් වැය කරන ලද තැපැල්, දුරකථන ගාස්තු සහ අන්තර්ජාල ප්‍රවේශය ඊ මේල් සඳහා ගෙවීම්

**3.1.14 මුද්‍රණ කටයුතු, ලිපි ද්‍රව්‍ය, සඟරා සහ පොත්, පුවත්පත් සඳහා වියදම්**

උදා - භාෆ් ෂීට්, ෆොටෝ කොපි කොළ, පෑන් ආදිය මිලදී ගැනීමට වැය වූ මුදල

**3.1.15 ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් කරන ලද ගමන් වියදම්**

දේශීයව හා විදේශීයව ආයතනික කටයුතු වෙනුවෙන් කරන ලද ගමන් වියදම්

**3.1.16 රක්ෂණ වාරික ගෙවීම් -** වර්ෂය තුළ රක්ෂණය වෙනුවෙන් දරණ ලද වියදම්

උදා - ගිනි රක්ෂණය, මුහුදු උවදුරු රක්ෂණය, මහා මාර්ග රථ වාහන රක්ෂණය, ගුවන් යානා රක්ෂණය, සොර සතුරු බිය පිළිබඳ රක්ෂණය.

**3.1.17 ලබා ගත් ණය සඳහා පොළී ගෙවීම්**

ආයතනය බැංකු මගින් හෝ වෙනත් මූල්‍ය ආයතන මගින් ලබා ගත් ණය සඳහා වර්ෂය තුල ගෙවන ලද මුළු පොළී මුදලේ වටිනාකම . තවද ආයතනයක් ව්‍යාපාර කටයුතු සඳහා කල් බදු යටතේ ( ලිසිං ) වාහනයක් මිලදී ගත්තේ නම් ඒ සඳහා ගෙවූ පොළී මුදලද මේ යටතේ සඳහන් කරන්න.

**3.1.18 වෙනත් බැංකු ගෙවීම් -** බැංකු විසින් තම ආයතනයට සපයන ලද වෙනත් සේවා සඳහා වර්ෂය තුල ගෙවන ලද මුළු මුදල

**උදා:**

- ගිණුම් ප්‍රකාශන
- චෙක් පොත්
- ආයතනය වෙනුවෙන් වෙනම සේප්පුවක් බැංකුවේ පවත්වාගෙන යෑම

**3.1.19 ප්‍රචාරක හා ප්‍රවර්ධන වියදම් -** දැන්වීම් පුවරු, බැනර්, පත්‍රිකා, ගුවන්විදුලි, රූපවාහිනි, පුවත් පත් දැන්වීම් වෙනුවෙන් දරණ ලද වියදම්

අනෙකුත් ආයතනයන්ට මුදල් ගෙවීම මගින් වෙළඳ පොළ ප්‍රචාරක ක්‍රියාවලින්ට වැය වූ මුදලද මේ යටතේ දක්වන්න

**3.1.20 ලියාපදිංචි සහ බලපත්‍ර ගාස්තු -**

මෙම කොටසට අදාල වන්නේ <u>බදු නොවන</u> වෙනත් බලපත්‍ර හා ලියාපදිංචි ගාස්තු වේ.

රජයට ගෙවන බලපත්‍ර ගාස්තු සඳහා රජය කිසියම් සේවාවක් එම ගාස්තු ගෙවන පුද්ගලයා /ආයතනය වෙනුවෙන් ඉටු කරයි නම් එය බද්දක් නොවන අතර එම වියදම් මෙහි ඇතුලත් කළ යුතුය.

**උදා:**

කිරුම් මිණුම් බලපත්‍ර ගාස්තු, විදේශ ගමන් බලපත්‍ර ගාස්තු, උසාවි ගාස්තු, රියදුරු බලපත්‍ර ගාස්තු. නමුත් රජය විසින් සමහර භාණ්ඩ අයිතිකර ගැනීම හා පාවිච්චි කිරීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු සහ ගාස්තු අය කිරීම වෙනුවෙන් සේවාවක් එම ගාස්තු ගෙවන පුද්ගලයාට ඉටු නොකරයි නම් එවැනි අය කිරීම් බදුවේ.

**3.1.21 හිමිකාර භාගය සඳහා ගෙවීම් (Payments for Royalty) –**

හිමිකාර භාගය (Royalty), ප්‍රකාශන අයිතිය (copyright), ස්වාධිකාරය ( patent), කීර්තිනාමය ( goodwill) ආදිය සඳහා ආයතන විසින් දරන ලද වියදම මේ යටතේ සඳහන් කළ යුතුය.

**3.1.23 ක්ෂය වීම් -**

- ස්පෘෂ්‍ය වත්කම් වල ක්ෂයවීම් "**ක්ෂයවීම්** " (Depreciation) ලෙස හඳුන්වයි

- ක්ෂයවීම් වටිනාකම ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, ලීබඩු, රථ වාහන ආදිය සඳහා වෙනස් ප්‍රතිශතයක් ගනී.

**3.1.24** **ක්‍රමක්ෂය -** අස්පෘෂ්‍ය වත්කම් වල ක්ෂයවීම් "**ක්‍රමක්ෂය**" (Amortization) ලෙස හඳුන්වයි.

**3.1.25** **කපා හරින ලද ණය**

ගැනුම්කරුවන්ගෙන් අයවිය යුතු එහෙත් ගෙවීම පැහැර හැර ඇති මුදල් ආයතනයේ ගිණුම් වලින් ඉවත් කිරීමක් ආයතනය මගින් සිදු කරයි.අදාළ යොමු කාලය තුළ එලෙස කපා හරින ලද ණය මුදල් වල වටිනාකම මේ යටතේ සඳහන් කළ යුතුය.

**3.1.26** **ස්ථාවර වත්කම් විකිණීමේදී සිදුවූ අලාභය**

යම් ස්වභාවික උපද්‍රවයක් නිසා හෝ හදිසි ආපදාවක් නිසා හෝ සොර සතුරු ආක්‍රමණයක් වැනි විවිධ හේතූන් නිසා යම් ස්ථාවර වත්කමකට හෝ ඉන් කොටසකට යම් හානියක් හෝ පාඩුවක් සිදුවූයේ නම් එම හානියේ හෝ පාඩුවේ වටිනාකම සටහන් කරන්න. භාවිතා කළ ස්ථාවර වත්කම් අලෙවි කිරීමේදී සිදු වූ අලාභය-

උදා: මෝටර් රථයක පොත් වල සඳහන් වටිනාකම රු. 1,000,000 ක් වුව ද එය විකුණනු ලැබූ වටිනාකම රු. 800,000ක් පමණක් නම් එහිදී සිදුවූ අලාභය වන රු. 200,000 ක මුදල හානි සහ පාඩු යටතට ඇතුළත් වේ.

**3.1.27** **ආයෝජන හා කොටස් මිලදී ගැනීමෙන් සිදුවූ අලාභය**

අදාළ යොමු කාලය තුළ ආයතනය ආයෝජනය, කොටස් මිලදී ගැනීම් , යන ආදිය මගින් සිදු වූ හානි සහ පාඩු මීට අයත් වේ.
උදා-කොටස් වෙළඳ පොළ ආයෝජන වලදී වෙළඳ පොළ මිල අඩු වීම

**3.1.28** **හුවමාරු අගය වෙනස්වීමේ අලාභය -** විදේශ හුවමාරු මගින් සිදු වූ හානි සහ පාඩු මීට අයත් වේ.

**3.1.29** **පර්යේෂණ සහ සංවර්ධන වියදම් -** ආයතනයේ සේවා ක්‍රියාවලිය ,

- අලුතින් ඇති කිරීමට
- වැඩි දියුණු කිරීමට
- ඒ සම්බන්ධ දැනුම වැඩි දියුණු කර ගැනීමට දරණ ලද වියදම

**3.1.30** **පාරිසරික ආරක්ෂණ වියදම්**

ආර්ථික ක්‍රියාකාරකම පවත්වාගෙන යෑමේ දී සිදුවන පරිසර දූෂණය අවම කිරීමේ හෝ වැළැක්වීමේ අරමුණින් සිදු කරනු ලබන සේවා සඳහා අදාළ යොමුකාලය තුළ ආයතනය විසින් දරන ලද වියදම මේ යටතේ සඳහන් කළ යුතුය.

**3.1.31** **වෙනත් වියදම්**

විනෝද චාරිකා, උත්සව සහ ඉහත 3.1.1 සිට 3.1.30 දක්වා වූ අයිතම යටතේ සඳහන් නොකළ, ආයතනය විසින් දරන ලද වියදමක් පවතී නම් එය මේ යටතේ දැක්විය යුතුය. උදා -

- කොටස් කරුවන්ගේ, කළමනාකරුවන්ගේ රැස්වීම් සඳහා වැයවන වියදම
- අවුරුදු උත්සව, නත්තල් උත්සව, ක්‍රීඩා උත්සව, විනෝද චාරිකා වෙනුවෙන් වැය වූ මුදල
- ව්‍යාපාරික සහ වෘත්තිය සංවිධාන සඳහා දායක මුදල්

**3.1.32** **මුදල් පරිත්‍යාග, දීමනා හා ත්‍යාග-**

වර්ෂය තුළ ආයතනය විසින් සිදු කරන ලද මුදල් පරිත්‍යාග, දීමනා, ත්‍යාග මුදල් වල වටිනාකමේ එකතුව මේ යටතේ දැක්විය යුතුය. උදා -

- දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- පාසල් පුස්තකාල සඳහා පොත් ලබාදීම.

**3.1.33** **නිෂ්පාදනය කරන ලද ඒකක ගණන මත පනවන බදු**

ආයතනය විසින් සිදු කරනු ලබන නිෂ්පාදනවල හෝ සපයනු ලබන සේවාවල ඒකක ගණන පදනම් කරගෙන අයකරනු ලබන බදු නිෂ්පාදන බදු වේ.
උදා - එකතුකළ අගය මත බදු, වෙළඳ බදු, ආයාත බදු, ජාතිය ගොඩනැගීමේ බදු,

රේගු බදු

**3.1.34 නිෂ්පාදනය මත පනවන වෙනත් බදු**

සමස්ථ නිෂ්පාදන ක්‍රියාවලිය මත පනවනු ලබන බදු මේ යටතේ ගැනේ.
උදා: පාරිසරික බදු, දේපළ බදු (වරිපනම් බදු)

**3.1.35 ව්‍යාපාර ලාභ මත අයකරන බදු**

ආයතනයේ මුළු ලාභය මත අයකරන බදු

## 3.2 වෙනත් ද්‍රව්‍ය මිලදී ගැනීම්

### 3.2.1 ඉන්ධන හා ලිහිසි තෙල්

ආයතනයේ ප්‍රයෝජනය පිණිස ඉන්ධන සහ ලිහිසි තෙල් මිලදී ගැනීම සඳහා වර්ෂය තුල වැය කල මුළු මුදල

### 3.2.2 අමු ද්‍රව්‍ය, අනෙකුත් ද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය, කුඩා මෙවලම් හා අමතර කොටස්

- වර්ෂයට අදාළව ආයතනය සතු අමුද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය, කුඩා මෙවලම් හා අමතර කොටස් ආදිය පිළිබඳ විස්තර මෙහි සඳහන් කළ යුතුවේ.
- පිරියම් කිරීම පිණිස වෙනත් ආයතනයකට සැපයූ අමුද්‍රව්‍ය ආදියෙහි වටිනාකම ද මෙයට අදාලවේ
- මෙම ද්‍රව්‍ය වල ඇගයීම ගැනුම්කරුගේ මිල ගණන් අනුව සිදු කළ යුතුය. ගැනුම් මිල, ප්‍රවාහන වියදම්, රක්ෂණ වියදම්, සියලුම අය බදු හා තීරු බදු මෙයට ඇතුළත් වේ.
- එහි දී ගැනුම්කරුට දෙන වට්ටම් හා ප්‍රතිදාන හෝ සපයන්නන් වෙතට ආපසු බාර දුන් ඇසුරුම් ද්‍රව්‍යවල වටිනාකම අඩු කළ යුතුය.
- ආයතනයට අනුබද්ධ ආයතන වලින් ලබාගත් අමු ද්‍රව්‍ය වෙනුවෙන් ගෙවීමක් නොකරන ලද නමුත් මිලදී ගත් අමු ද්‍රව්‍ය ලෙස සලකා ඇගයිය යුතුය.

### 3.2.3 අලෙවි කිරීම සඳහා මිලදී ගන්නා ලද අයිතම

මිලදී ගත් ආකාරයෙන්ම කිසියම් පිරියම් කිරීමක් හෝ සිදු නොකොට නැවත විකුණන භාණ්ඩ තොගයයි.

### 3.2.4 දේපල වෙළදාම් කිරීම සඳහා මිලදී ගත් දේපළ

දේපල වෙළදාම් කරනු ලබන ආයතනයක් වර්ෂය තුල නැවත විකිණීම සඳහා මිලදී ගත් ඉඩම් හා නිවාස වල වටිනාකම

# 4 කොටස - 2020 හෝ 2020/2021 මුදල් වර්ෂය සඳහා ආදායම

- ආයතනය ගිණුම් පවත්වා ගෙන යනු ලබන්නේ 2020.01.01 සිට 2020.12.31 දිනට අදාළව නම් එම කාලය තුළ ආයතනය උපයන ලද ආදායම පිළිබඳ විස්තර මෙහි සඳහන් කළ යුතුය.
- ආයතනය ගිණුම් පවත්වාගෙන යනු ලබන්නේ 2020/2021 මූල්‍ය වර්ෂයට අදාළව නම් 2020.04.01 දින සිට 2021.03.31 කාලය තුළ ආයතනය උපයන ලද ආදායම පිළිබඳ විස්තර මේ යටතේ සඳහන් කළ යුතුය.

## 4.3 වෙනත් ආදායම්

ඉහත 4.1 සිට 4.2.2 දක්වා වූ ආර්ථික ක්‍රියාකාරකම් වලින් එකක හෝ නියුතු ආයතන වල වෙනත් ආදායම් මූලාශ්‍ර ද පැවැතිය හැකි ය. එම ආදායම් මූලාශ්‍ර පිළිබඳ කෙටි විස්තරයක් පහත 4.3.1 සිට 4.3.17 දක්වා වූ අයිතම යටතේ දක්වා ඇත.

**4.3.1** **භාවිත කරන ලද භාණ්ඩ අලෙවි කිරීම -** භාවිත කරන ලද භාණ්ඩ ,

- නව තාක්ෂණය ලබා ගැනීම,
- නවීකරණය කිරීම,
- භාවිත කළ පසු තවදුරටත් ප්‍රයෝජනවත් නොවීම නිසා අලෙවි කළේ නම් ඉන් ලැබුණ ආදායම

**4.3.2** **සුන්බුන් සහ අපද්‍රව්‍ය අලෙවි කිරීම**

ආයතනයේ සුන්බුන්, අපද්‍රව්‍ය ආදිය අලෙවි කර ලබන ආදායම

උදා: කැඩී බිඳී ඇති කාර්යාලයීය උපකරණ සහ ගෘහ භාණ්ඩ ආදිය අලෙවි කිරීම

**4.3.3** **ප්‍රවාහන සේවා සැපයීම**

ප්‍රවාහන සේවා මගින් උපයන ආදායම් මීට අයත් වේ.

අලෙවි කරන ලද සේවාව පාරිභෝගිකයා වෙත ප්‍රවාහනය කර දීමෙන් ලද ආදායමද දැක්විය යුතු ය.

**4.3.7** **පොලී ලැබීම්**

ආයතනයක් තම මූල්‍ය වත්කම් වෙනත් ආයතනයක (බැංකු හා මූල්‍ය ආයතන වල) තැන්පත් කිරීමෙන් හෝ ණයකර මිලදී ගැනීමෙන් ලැබෙන පොලී අදායම මින් අදහස් කෙරේ. මෙලෙස උපයන ලද මුදල මේ යටතේ දැක්විය යුතුය.

**4.3.8** **ලාභාංශ ලැබීම්**

ආයතනය කිසියම් සමාගමක කොටස් මිල දී ගෙන ඇත්නම් එම කොටස් වෙනුවෙන් 2020 වර්ෂයේ ලැබුණ ලාභාංශ මුදල මේ යටතේ දැක්විය යුතුය.

**4.3.9** **හිමිකම් භාගය (Royalty income) -** කිසියම් ආයතනයක් තම ආයතනයට අයත්

- වෙළඳ ලකුණ (trade mark)
- පේටන්ට් (patent)
- ප්‍රකාශන අයිතිය (copyright)
- අයිතිය පැවැරීමේ ගාස්තු ( franchise) ආදිය අලෙවි කර එමගින් 2020 වර්ෂය තුළ උපයන ලද ආදායම මේ යටතේ දැක්විය යුතු ය.

**4.3.11** **සුරැකුම් පත්, ව්‍යාපාර වස්තු, අලෙවි කළ හැකි සුරැකුම්පත් සහ වෙනත් මූල්‍ය වත්කම් වලින් ලැබීම්.**

සුරැකුම් පත්, ව්‍යාපාර වස්තු, අලෙවි කළ හැකි සුරැකුම්පත් ආදිය මගින් ආයතනය උපයන ආදායම් මේ යටතේ සඳහන් කළ යුතු ය.

**4.3.12** **විදේශ හුවමාරුලැබීම්**

ජාත්‍යන්තර ගණුදෙණු වල දී විනිමය අනුපාත වෙනස් වීම මත ආයතනට අත් වන වාසි මේ යටතේ ගැනේ.

**4.3.13** **රක්ෂණ සේවා ලැබීම්**

වත්කම් වලට සිදු වූ හානියක් වෙනුවෙන් රක්ෂණ හිමිකම් (Insurance claim) ලෙස වර්ෂය තුල ලැබුණ මුදල

උදා: ආයතනය සතු මෝටර් රථයක් අනතුරකට පත්වූවිට හානියේ වටිනාකම ලෙස අදාළ රක්ෂණ සමාගමෙන් ලැබුණ මුදල

**4.3.14** **ප්‍රදාන සහ පරිත්‍යාග-**

කිසියම් ආයතනයකට රජයෙන් හෝ වෙනත් ආයතනයක් මගින් ප්‍රදානයක් හෝ පරිත්‍යාගයක් වර්ෂය තුල දී ලැබුනේ නම් ඒ පිළිබඳ විස්තර මේ යටතේ දැක්විය යුතුය.

**4.3.15** **සහනාධාර**

සහනාධාර යනු මහජනතාවගේ යහපත උදෙසා ආයතනයක ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යැමට හෝ සංවර්ධනයට රජයෙන් දෙනු ලබන විශේෂ දීමනාවක් හෝ බදු සහනයක් වේ.

**4.3.17** **වෙනත්ආදායම්**

ඉහත සඳහන් කුමන හෝ අයිතයමක් යටතේ සටහන් නොකරන ලද ආදායම් මූලශ්‍රයක් පවතී නම් එය සඳහන් කරන්න

## 5 කොටස : 2020 හෝ 2020/2021 මුදල් වර්ෂයට අදාළ ස්ථාවර වත්කම්

**තීරු අංක 01:**

**5.2** **ඉඩම් වැඩිදියුණු කිරීම් -** තාප්ප ගැසීම, කාණු පද්ධති සැකසීම ආදී කටයුතු

**5.3** **නේවාසික ගොඩනැගිලි -** ආයතනය සතු නේවාසිකාගාර, නිල නිවාස

**5.4** **අනෙකුත් ගොඩනැගිලි**

උදා: කාර්යාල, ගබඩා, ගරාජ්

**5.5** **අනෙකුත් ඉදිකිරීම් -** මාර්ග, කාණු, පාලම් ආදිය

**5.6** **ප්‍රවාහන උපකරණ -**

පුද්ගලයින් සහ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගන්නා මෝටර් රථ හා වෙනත් ප්‍රවාහන උපකරණ උදා : කාර්, වෑන්, ලොරි

**5.7** **පරිගණක හා උපාංග -** ආයතන පරිපාලන හෝ වෙනත් කටයුතු සඳහා යොදා ගන්නා පරිගණක හා ඊට අදාළ අනිකුත් උපාංග මීට අයත් වේ.
උදා: පරිගණක ( Desktop/Laptop), මුද්‍රණ යන්ත්‍රය, ෆැක්ස් යන්ත්‍රය, ස්කෑන් යන්ත්‍රය

**5.8** **යන්ත්‍ර හා උපකරණ**
ආර්ථික ක්‍රියාකාරකම සිදු කිරීමට යොදා ගන්නා ආයතනය සතු සියලුම යන්ත්‍ර සූත්‍ර සහ ඊට අදාළ වෙනත් උපකරණ වල වටිනාකම මින් අදහස් කරයි.
උදා: වෛද්‍ය උපකරණ, ටෙලර් යන්ත්‍ර (ATM), විදුලි ජනක යන්ත්‍ර

**5.9** **ගෘහභාණ්ඩ හා වෙනත් කාර්යාලයීය උපකරණ**
ආයතන කටයුතු පවත්වාගෙන යාම සඳහා යොදා ගන්නා ගෘහ භාණ්ඩ හා අනෙකුත් කාර්යාල උපකරණ වල වටිනාකම මෙයින් අදහස් කරයි.
උදා: මේස, පුටු, කබඩ්, ෆැක්ස් යන්ත්‍ර, දුරකථන යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර ආදිය

**5.10** **කරගෙන යනු ලබන වැඩ (Work in Progress)**
ස්ථාවර වත්කමක් ලෙස හඳුනාගත හැකි නමුත් 2020.12.31 / 2021.03.31 දින වන විට ද ඊට අදාළ කටයුතු අවසන් කර නොමැති කරගෙන යනු ලබන කටයුතු වල වටිනාකම් මෙමඟින් අදහස් කරයි.
තවද මෙම වත්කම් නිෂ්පාදනයක් හෝ සේවා සැපයීමක් සඳහා යොදා ගත නොහැකිය.

උදා: ඉදිකරගෙන යනු ලබන ගොඩනැගිල්ල,

**5.11** **අනෙකුත් ස්පෘෂ්‍ය ස්ථාවර වත්කම්**

ඉහත සඳහන් කළ ස්පෘෂ්‍ය ස්ථාවර වත්කම් වලට අමතරව වෙනත් ස්පෘෂ්‍ය වත්කමක් ආයතනය සතුව පවතී නම් එම වත්කමෙහි නම සඳහන් කර අදාළ විස්තර සැපැයිය යුතු වේ.

උදා: මැණික්, ස්වර්ණාභරණ, කෞතුක භාණ්ඩ (antiques)

**<u>අස්පෘෂ්‍ය ස්ථාවරවත්කම්</u>**

භෞතික පැවැත්මක් නැති මූල්‍ය නොවන වත්කම් අස්පෘෂ්‍ය ස්ථාවර වත්කම් වේ.

**5.12** **බුද්ධිමය දේපළ**

පේටන්ට් බලපත්‍රය

**5.13 පරිගණක මෘදුකාංග හා දත්ත පදනම**

පරිපාලන හා වෙනත් කටයුතු සඳහා යොදාගනු ලබන විවිධ මෘදුකාංග හා දත්ත පදනම්

**උදා:** ගිණුම්කරණ පැකේජ, මිල දී ගත් දත්ත පදනම්, ආයතනය විසින් සකස් කරන ලද දත්ත පදනම්

**5.14 වෙනත් අස්පෘෂ්‍ය ස්ථාවර වත්කම්**

ඉහත සඳහන් නොවූ යම් අස්පෘශ්‍ය ස්ථාවර වත්කමක් වේ නම් ඒ පිළිබඳ විස්තර

**උදා:** කීර්ති නාමය,වෙළඳ ලකුණ

**තීරු අංක 02: වර්ෂය ආරම්භයේ පොතෙහි සඳහන් වටිනාකම**

2020.01.01 /2020.04.01 දිනට පොතේ සඳහන් කර ඇති අදාළ ස්ථාවර වත්කමෙහි අගයයි.

**තීරු අංක 03: වර්ෂය තුළ අත්පත් කරගන්නා ලද ස්ථාවර වත්කම්**

ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ දී සම්පූර්ණ වටිනාකම ම හෝ කොටසක් ගෙවා මිල දී ගත හැකිය. නමුත් මෙහි දී එම වත්කමෙහි සම්පූර්ණ වටිනාකම ම දැක්විය යුතු ය.
එකම සමාගමකට අයත් වෙනත් ආයතනයකින් ලැබුන ස්ථාවර වත්කම් ද මිල දී ගත් ස්ථාවර වත්කම් සේ සළකා මීට ඇතුළත් කළ යුතු ය.

**තීරු අංක 04 : ආයතනය විසින්ම කරන ලද ප්‍රාග්ධන සම්පාදන**

ආයතනය සතු සම්පත් යොදාගෙන ආයතනය විසින්ම ඇතැම් ස්ථාවර වත්කම් සම්පාදනය කරනු ලැබේ.

**උදා:** ආයතනයක් තමා සතු සම්පත් උපයෝගී කර ගෙන සකස් කරන ලද මුරකුටි

**තීරු අංක 05 : ස්ථාවර වත්කම් වල අගය නැවත තක්සේරු කිරීම**

ස්ථාවර වත්කමක වර්තමාන අගය තක්සේරු කිරීම මෙහි දී සිදු වේ.

**තීරු අංක 06: අලෙවි කරන ලද ස්ථාවර වත්කම්**

- ස්ථාවර වත්කමක් අලෙවි කරනු ලැබුවේ නම්
- ඉවත් කරන්නේ නම්
- අනුබද්ධිත ආයතනයකට ලබා දෙන්නේ නම්

එම ස්ථාවර වත්කමේ වටිනාකම සඳහන් කරන්න. මෙහි දී පොතේ සඳහන් අගය නොව, අලෙවි කරන ලද අගය සඳහන් කළ යුතුය.

**උදා:** ආයතනය සතු මෝටර් රථයක් රු.4,000,000/- කට අලෙවි කර ඇත. එහි පොත් අගය රු. 4,500,000 කි. අලෙවි කළ ස්ථාවර වත්කමේ අගය වනුයේ රු. 4,000,000 කි.

**තීරු අංක 07 : පාඩු හා හානි**

යම් ස්වභාවික උපද්‍රවයක් නිසා හෝ හදිසි ආපදාවක් නිසා හෝ සොර සතුරු ආක්‍රමණයක් වැනි විවිධ හේතූන් නිසා යම් ස්ථාවර වත්කමකට හෝ ඉන් කොටසකට යම් හානියක් හෝ පාඩුවක් සිදුවූයේ නම් එම හානියේ හෝ පාඩුවේ වටිනාකම මේ යටතේ සටහන් කරන්න.

භාවිතා කළ ස්ථාවර වත්කම් අලෙවි කිරීමේදී සිදු වූ අලාභය

උදා:

මෝටර් රථයක පොත් වල සඳහන් වටිනාකම රු. 1,000,000 ක් වුව ද එය විකුණනු ලැබූ වටිනාකම රු. 800,000ක් පමණක් නම් එහිදී සිදුවූ අලාභය වන රු. 200,000 ක මුදල හානි සහ පාඩු යටතට ඇතුළත් වේ.

**තීරු අංක 08: වර්ෂය තුළ ස්ථාවර වත්කම් වල ක්ෂයවීම් (ස්පෘෂ්‍ය හා අස්පෘෂ්‍ය වත්කම්)**

ස්ථාවර වත්කම් වල පිරිවැය එම වත්කමෙහි ජීවිත කාලය පුරා බෙදාහැරීම ක්ෂය කිරීම මගින් සිදු වේ.

අස්පෘශ්‍ය වත්කම් වල ක්ෂයවීම් "**ක්‍රමක්ෂය**" (Amortization) ලෙස හඳුන්වයි.
ක්ෂයවීම් වටිනාකම ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, ලීබඩු, රථ වාහන ආදිය සඳහා වෙනස් ප්‍රතිශතයක් ගනී.

උදා:
රු. 50,000 ක් වටිනා පරිගණක යන්ත්‍රයක් වසර 10 ක් භාවිතා කළ හැකි යැයි සිතමු. එම පරිගණක යන්ත්‍රයේ එක් වසරක ක්ෂයවීම් වල වටිනාකම මුළු වටිනාකමින් දහයෙන් කොටසකි. එනම්(රු. 50,000/10) = රු. 5000/- කි.

**තීරු අංක 09:** **වර්ෂ අවසානයේ දී ස්ථාවර වත්කම් වල මුළු වටිනාකම**

**9 = ( 2 + 3 + 4 + 5 – 6 – 7 – 8 )**

**තීරු අංක 10:** වර්ෂය සඳහා ස්ථාවර වත්කම් වල සාධාරණ අගය

2020.12.31/ 2021.03.31 දිනට පොතේ සඳහන් වටිනාකම .